# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,664 - 2010 ජූලි මස 23 වැනි සිකුරාදා - 2010.07.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1204 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1204 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 ජූලි මස 30 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 ජූලි මස 16 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම්**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකියඃ-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම.
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඞ්බෝඞ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිඳු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කැලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — කළුතර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 65 ට වැඩි නොවිය යුතු ය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2010 අගෝස්තු මස 23 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2010ක් වූ ජූලි මස 07 වැනි දින,
බත්තරමුල්ල,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234/A3 හි
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කළුතර | කළුතර | කළුතර දිස්ත්‍රික්කයේ උග්ගල්බඩ කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා පානදුර තොටමුණ කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර. |

07-718

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## මධ්‍යම ආණ්ඩුව යටතේ ජාතික පාසැල් සඳහා බඳවා ගත් කළමනාකරණ සහකාර තනතුරුධාරීන් සඳහාවන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2010

ඉහත තනතුරුවලට අයත් නිලධාරීන් සඳහා අදාළ අනුමත බඳවා ගැනීමේ පරිපාටිවල විධිවිධානයන්ට අනුකූලව පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් 2010 ඔක්තෝබර් මාසයේ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. (i) මෙම විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ.

(ii) විභාග අපේක්ෂකත්වය ලැබීම සඳහා පනවා ඇති නීති *ගැසට්* නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනවා ඇත.

(iii) මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගයට නියමිත විෂයයන් දෙකම, එක් වතාවක දී හෝ දෙවතාවක දී පෙනී සිට සමත් විය හැකිය.

(iv) මෙම විභාගය සඳහා ඉල්ලුම් කළ හැක්කේ මධ්‍යම ආණ්ඩුව යටතේ ජාතික පාසල් සඳහා බඳවා ගනු ලැබූ කළමනාකරණ සහකාර තනතුරුධාරීන් සඳහා පමණි.

03. *විභාග ගාස්තු*.—මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා පළමුවන වතාවට ඉදිරිපත්වන අයදුම්කරුවන්ගෙන් විභාග ගාස්තු අය නොකෙරේ. ඉන්පසු වතාවකට පෙනී සිටින්නේ නම් රුපියල් 400 ක විභාග ගාස්තුවක් අයකෙරේ. (එක් විෂයයක් වුව ද රුපියල් 400 කි.) මෙම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003.02.13ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම දිස්ත්‍රික්ක/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ලබාගන්නා ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ එහි දාරයක් ඇලවිය යුතුය. (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

04. *අයදුම්පත්‍ර*.—ඉල්ලුම් පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. මෙම ආදර්ශ අයදුම්පත අනුව 'ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කළ යුතු අතර, ශීර්ෂ අංක 01 සිට 04 තෙක් පළමුවන පිටුවටත්, ඉතිරිය දෙවන පිටුවටත් වන ලෙස ගෙන සකස් කළ යුතුය. ඉල්ලුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතර ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීමට අවශ්‍යය. අයදුම්පත්‍රය යතුරුලියනය කර පිළියෙළ කරගත හැකි වුව ද එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරෙන්ම සම්පූර්ණ කළ යුතුය. ඒ අනුව පිළියෙල කරන ලද අයැදුම්පත් අපේක්ෂකයින් විසින් සිය කලාප අධ්‍යාපන

අධ්‍යක්ෂ/ පීඨාධිපති/දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් 2010.08.20 වැනි දිනට පෙර ලැබෙන සේ බත්තරමුල්ල, පැලවත්ත, විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් වෙත ශ්‍රී ලංකා ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයැදුම්පත එවීමේ දී ලියුම් කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළයුතුය. අයැදුම්පත සමග පත්වීම් ලිපියේ සහතික කරන ලද ඡායා පිටපතක් ද අමුණා එවිය යුතුය. අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයැදුම්පත් හා භාරගැනීමේ අවසන් දිනට පසුව ලැබෙන අයැදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. එම ඉල්ලුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයැදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර එසේ නොවුනහොත් ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේප වනු ඇත.

05. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව.*—අපේක්ෂකයින් විභාග ශාලාව තුළ දී පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතරින් කුමක් වුව ද භාරගනු ලැබේ. :-

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,

2. වලංගු විදේශීය ගමන් බලපත්‍රය.

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයැදුම්කරුවකුගේ අපේක්ෂකත්වය සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වේ.

06. අයැදුම්පත් පිළිගෙන ඇති නිලධාරීන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාලසටහනේ පිටපතක් සමග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. අයැදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයැදුම්පත්‍රයේ සහතික කළ ඡායා පිටපතක් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශපත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායි වනු ඇත.

07. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු දිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

08. තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයිය හැකිය. තමන් ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. විභාගය පැවැත්වෙන්නේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පමණි.

09. මෙම විභාගය කොළඹ දී පමණක් පවත්වනු ලැබේ.

10. *විභාග පරිපාටිය* :

(ඉහත තනතුරුවලට අදාළ විභාගය පහත සඳහන් විෂයන්ගෙන් සමන්විත වනු ඇත)

| *විෂයය* | *විෂය අංකය* | *ලකුණු* | *කාලය* |
|---|---|---|---|
| 01. ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි | 01 | 100 යි | පැය 03 යි |
| 02. සංවර්ධන පරිපාලනය | 02 | 100 යි | පැය 03 යි. |

(01) පළමුවන ප්‍රශ්න පත්‍රය (ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි) :
- (i) ආයතන සංග්‍රහයේ I, II, VI, XII පරිච්ඡේද,
- (ii) ආයතන සංග්‍රහයේ දෙවන කාණ්ඩයේ සියලු පරිච්ඡේද,
- (iii) මුදල් රෙගුලාසි IV සහ V පරිච්ඡේද.

(02) දෙවන ප්‍රශ්න පත්‍රය (සංවර්ධන පරිපාලනය) :
- (i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා එකී 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය,
- (ii) පළාත් සභා පනත හා එකී සංශෝධන,
- (iii) අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය හා එහි විවිධ මට්ටම්වලට පැවරෙන රාජකාරි විස්තර.

(සාමාර්ථ්‍යයක් ලැබීම සඳහා එක් එක් විෂයයේ ලකුණුවලින් අවම වශයෙන් 40%ක් බැගින් හෝ ඊට වැඩියෙන් නිලධාරීන් විසින් ලබාගත යුතු වේ.)

11. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

12. මෙම විභාග නිවේදනය මගින් විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

සුනිල් එස්. සිරිසේන,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2010 ජූලි මස 05 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
'ඉසුරුපාය,' බත්තරමුල්ල.

*ආදර්ශ අයැදුම්පත්‍රය*

**මධ්‍යම ආණ්ඩුව යටතේ ජාතික පාසල් සඳහා බඳවා ගනු ලැබූ කළමනාකරණ සහකාර තනතුරුධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2010**

First Efficiency Bar Examination for Management Assistants recruited for National Schools under the Central Government - 2010

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය ☐

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
අදාළ අංකය කොටුව තුළ ලියන්න.

01. මුලකුරු අගට යොදා අයැදුම්කරුගේ මුලකුරු සමඟ නම :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : SUNIL, J. M. U.

1.1 මුලකුරුවලින් හැඳින්වෙන නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.2 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.3 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

02. සේවා ස්ථානය හා ලිපිනය :———.

2.1 විදුහලේ/විද්‍යා පීඨයේ/ගුරු විදුහලේ/කාර්යාලයේ නම :———.

2.2 රාජකාරි ලිපිනය :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

03. දැනට දරන තනතුර :———.
(පත්වීම් ලිපියේ සහතික කරන ලද පිටපතක් අමුණන්න.)

3.1 පත්වීම් ලිපියේ අංකය :———.

3.2 පත්වීම් දිනය :———.

04. ඔබ දැන් ඉදිරිපත් වන විෂයය/විෂයයන් (*ගැසට් නිවේදනයේ* 10 ඡේදය බලන්න)

| *අනු අංකය* | *විෂයය* | *විෂයය අංකය* |
|---|---|---|
| 01. | | |
| 02. | | |

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට හිමිකම ඇති බවත් ප්‍රකාශ කරන අතර මෙම විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකඟවන බව ද ප්‍රකාශ කර සිටිමි.

———,
අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත්සන.

දිනය :———.

*සටහන*.—තම දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියකු ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

ලදුපත මෙහි අලවන්න. (අදාළ නම් පමණි)

ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

### *අත්සන සහතික කිරීම*

මගේ කාර්යාලයේ/විදුහලේ/විද්‍යාපීඨයේ/ගුරු විදුහලේ නිලධාරියකු/ නිලධාරිණියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ...................... මයා./මිය./මෙනෙවිය ................. දින මා ඉදිරිපිට දී අත්සන් කළ බව මම සහතික කරමි.

———,
අත්සන සහතික කරන්නාගේ
අත්සන හා නිල මුද්‍රාව.
(විදුහල්පති/පීඨාධිපති/ගුරු විදුහල්පති/
මාණ්ඩලික නිලධාරි).

නම :———.

පදවි නාමය :———.

ලිපිනය :———.

දිනය :———.

### *දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*

1. ඉහත සපයා ඇති විස්තර පරීක්‍ෂා කර බැලූ බවත්,
2. පත්වීම් ලිපියේ සහතික කරන ලද පිටපතක් අමුණා ඇති බවත්,
3. නිලධාරියා/නිලධාරිණිය මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත් සහතික කරමි.

———,
සහතික කරන්නාගේ
අත්සන හා නිල මුද්‍රාව.
(කලාප අධ්‍යාපන අධ්‍යක්‍ෂ/පීඨාධිපති/
දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම :———.

පදවි නාමය :———.

ලිපිනය :———.

දිනය :———.

07-719/1

---

## මධ්‍යම ආණ්ඩුව යටතේ ජාතික පාසැල් සඳහා බඳවා ගත් කළමනාකරණ සහකාර තනතුරුධාරීන් සඳහාවන දෙවන කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය - 2010

ඉහත තනතුරුවලට අයත් නිලධාරීන් සඳහා අදාළ අනුමත බඳවා ගැනීමේ පරිපාටිවල විධිවිධානයන්ට අනුකූලව දෙවන කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් 2010 ඔක්තෝබර් මාසයේ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. (i) මෙම විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්‍ෂකයින් යටත් වේ.

(ii) විභාග අපේක්‍ෂකත්වය ලැබීම සඳහා පනවා ඇති නීති *ගැසට්* නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනවා ඇත.

(iii) මෙම විභාගය සඳහා ඉල්ලුම් කළ හැක්කේ මධ්‍යම ආණ්ඩුව යටතේ ජාතික පාසල් සඳහා බඳවා ගනු ලැබූ කළමනාකරණ සහකාර තනතුරුධාරීන් සඳහා පමණි.

03. *විභාග ගාස්තු*.-මෙම කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය සඳහා පළමුවන වතාවට ඉදිරිපත්වන අයදුම්කරුවන්ගෙන් විභාග ගාස්තු අය නොකෙරේ. ඉන්පසු වතාවකට පෙනී සිටින්නේ නම් රුපියල් 400 ක විභාග ගාස්තුවක් අයකෙරේ. මෙම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003.02.13ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම දිස්ත්‍රික්ක/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ලබාගන්නා ලදුපත අයැදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ එහි දාරයක් ඇලවිය යුතුය. (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

04. *අයැදුම්පත්‍ර.*-ඉල්ලුම් පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. මෙම ආදර්ශ අයැදුම්පත අනුව 'ඒ 4' ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කළ යුතු අතර, ශීර්ෂ අංක 01 සිට 03 තෙක් පළමුවන පිටුවටත් ඉතිරිය දෙවන පිටුවටත් වන ලෙස ගෙන සකස් කළ යුතුය. ඉල්ලුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතර ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීමට අවශ්‍යය අයදුම්පත්‍රය යතුරුලියනය කර පිළියෙලකරගත හැකි වුවද එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරෙන්ම සම්පූර්ණ කළ යුතුය. ඒ අනුව පිළියෙල කරන ලද අයැදුම්පත් අපේක්ෂකයින් විසින් සිය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/පීඨාධිපති /දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් 2010.08.20 වැනි දිනට පෙර ලැබෙන සේ "බත්තරමුල්ල, පැලවත්ත, විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල්" වෙත ශ්‍රී ලංකා ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයැදුම්පත එවීමේ දී ලියුම් කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළයුතුය. අයැදුම්පත සමග පත්වීම් ලිපියේ සහතික කරන ලද ඡායා පිටපතක් ද අමුණා එවිය යුතුය. අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයැදුම්පත් හා භාරගැනීමේ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. එම ඉල්ලුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර එසේ නොවුනහොත් ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේප වනු ඇත.

05. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව.—අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතරින් කුමක් වුවද භාරගනු ලැබේ. :-

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,
2. වලංගු විදේශීය ගමන් බලපත්‍රය,

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයැදුම්කරුවකුගේ අපේක්ෂකත්වය සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වේ.

06. අයැදුම්පත් පිළිගෙන ඇති නිලධාරින් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාලසටහනේ පිටපතක් සමග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. අයැදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 2ක් හෝ 3ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයැදුම්පත්‍රයේ සහතික කළ ඡායා පිටපතක් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශපත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායි වනු ඇත.

07. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු දිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

08. තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයිය හැකිය. තමන් ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. විභාගය පැවැත්වෙන්නේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පමණි.

09. මෙම විභාගය කොළඹ දී පමණක් පවත්වනු ලැබේ.

10. *විභාග පරිපාටිය :*

(ඉහත තනතුරට අදාළ විභාගයට පහත සඳහන් විෂයය අයත් වේ.

| *විෂයය* | *විෂය අංකය* | *ලකුණු* | *කාලය* |
|---|---|---|---|
| 01. කළමනාකරණය සහ කාර්යාල ක්‍රම | 01 | 100 යි | පැය 03 යි |

(01) කළමනාකරණය සහ කාර්යාල ක්‍රම (විෂය නිර්දේශය)

* මහජන සම්බන්ධතා හා සන්නිවේදනය
* සහභාගිත්ව සංවර්ධනය පිළිබඳ සංකල්පය
* රාජ්‍ය අංශයේ ඵලදායිතාව හා කාර්යක්ෂමතාව
* සැලසුම්කරණය හා ඒ පිළිබඳ උපාය මාර්ග
* ව්‍යාපෘති වාර්තා සකස් කිරීම - ප්‍රගති සමාලෝචනය හා මෙහෙයවීම
* ලේඛන නඩත්තුව

(මෙම විභාගය සමත්වීම සඳහා ඉහත ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් ලකුණු 40%ක් හෝ ඊට වැඩියෙන් නිලධාරීන් විසින් ලබාගත යුතු වේ.)

11. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

12. මෙම විභාග නිවේදනය මගින් විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

සුනිල් එස්. සිරිසේන,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2010 ජූලි මස 05 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය
'ඉසුරුපාය', බත්තරමුල්ල.

*ආදර්ශ අයැදුම්පත්‍රය*

මධ්‍යම ආණ්ඩුව යටතේ ජාතික පාසල් සඳහා බඳවා ගනු ලැබූ කළමනාකරණ සහකාර තනතුරුධාරීන් සඳහාවන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2010

Second Efficiency Bar Examination for Management Assistants recruited for National Schools under the Central Government - 2010

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය අදාළ අංකය කොටුව තුළ ලියන්න. : ☐ සිංහල - 2 / දෙමළ - 3 / ඉංග්‍රීසි - 4

01. මුලකුරු අගට යොදා අයැදුම්කරුගේ මුලකුරු සමඟ නම :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : SUNIL. J. M. U.

1.1 මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.2 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)
1.3 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

02. සේවා ස්ථානය හා ලිපිනය :————.
2.1 විදුහලේ/විද්‍යා පීඨයේ/ගුරු විදුහලේ/කාර්යාලයේ නම :————.
2.2 රාජකාරි ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

03. දැනට දරන තනතුර :————.
(පත්වීම් ලිපියේ සහතික කරන ලද පිටපතක් අමුණන්න.)
3.1 පත්වීම් ලිපියේ අංකය :————.
3.2 පත්වීම් දිනය :————.

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට හිමිකම ඇති බවත් ප්‍රකාශ කරන අතර මෙම විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකඟවන බවද ප්‍රකාශ කර සිටිමි.

————,
අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත්සන.

දිනය :————.

*සටහන.*—තම දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියකු ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

ලදුපත මෙහි අලවන්න. (අදාළ නම් පමණි)

ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

**අත්සන සහතික කිරීම**

මගේ කාර්යාලයේ/විදුහලේ/විද්‍යාපීඨයේ/ගුරු විදුහලේ නිලධාරියකු/ නිලධාරිණියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ...................... මයා/මිය/මෙනෙවිය ................. දින මා ඉදිරිපිට දී අත්සන් කළ බව මම සහතික කරමි.

————,
අත්සන සහතික කරන්නාගේ
අත්සන හා නිල මුද්‍රාව.
(විදුහල්පති/පීඨාධිපති/ගුරු විදුහල්පති/
මාණ්ඩලික නිලධාරී)

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

1. ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්,
2. පත්වීම් ලිපියේ සහතික කරන ලද පිටපතක් අමුණා ඇති බවත්
3. නිලධාරියා/නිලධාරිණිය මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ
අත්සන හා නිල මුද්‍රාව.
(කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/පීඨාධිපති/
දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

07-719/2

---

**උසස් අධ්‍යාපන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE)

**උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාවට (HNDE)**

***සිසුන් ඇතුළත් කිරීම 2010/2011 අධ්‍යාපන වර්ෂය***

යථෝක්ත පාඨමාලාව සඳහා සුදුසුකම් සපුරා ඇති අයැදුම්කරුවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වෙන පූර්ණකාලින තුන් අවුරුදු න්‍යායික හා හය මාසික වැඩබිම් පුහුණුව ඇතුළත් පාඨමාලාවක් වන අතර සිවිල්, විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු යන විශේෂිත ඉංජිනේරු ක්ෂේත්‍රයන්ගෙන් සමන්විත වේ. උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලා සහතිකය, ලන්ඩන් ඉංජිනේරු මණ්ඩලයේ CEI (ලන්ඩන්) විභාගයේ පළමු අදියරෙන් නිදහස් වීම සඳහා සුදුසුකමක් වන අතර එමගින් ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ප්‍රථම විභාගයෙන් නිදහස්වීම සඳහා ද එය සුදුසුකමක් වනු ඇත.

මේ හැරුණු විට දකුණු ඕස්ට්‍රේලියානු විශ්ව විද්‍යාලයේ (University of South Australia) සිව් අවුරුදු ඉංජිනේරු පාඨමාලාව (B. Sc.) උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලා සහතිකයේ සුදුසුකම් පහත දැක්වෙන පරිදි අගැයීමට ලක්වී ඇත.

1. යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රය සඳහා - වසර 02ක නිදහස් කිරීමක් ද,
2. සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රය සඳහා - වසර 02ක නිදහස් කිරීමක් ද,
3. විදුලි ඉංජිනේරු ක්ෂේත්‍රය සඳහා - වසර 1 1/2 ක නිදහස් කිරීමක් ද සිදු කරයි.

මහා බ්‍රිතාන්‍යයේ ඇතැම් පිළිගත් විශ්ව විද්‍යාල උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාලාභීන්හට ඔවුන්ගේ ඉංජිනේරු පාඨමාලාව එක් වසරකින් නිම කිරීම සඳහා IELTS විභාගයෙන් නිදහස්ව පහසුකම් සලසා ඇත. තව ද, මෙලෙස උපාධිය සාර්ථකව නිම කරන්නන් සඳහා මහා බ්‍රිතාන්‍යයේ වසර 02ක රැකියා බලපත්‍රය ද හිමිවනු ඇත.

මෙම පාඨමාලාවේ විෂය නිර්දේශ, භෞතික හා මානම් සම්පත් ඔස්ට්‍රියා හා නෙදර්ලන්ත රාජ්‍යයන්ගේ අනුග්‍රහය යටතේ සංවර්ධනය වේ.

පාඨමාලාව පැවැත්වෙන ආයතන, ඒවායේ ලිපිනයන් හා දුරකථන අංක —

| | ආයතනය | ලිපිනය | දුරකථන අංක |
|---|---|---|---|
| 1. | උසස් තාක්ෂණ ආයතනය මට්ටක්කුලිය | අංක 42, රොද්‍රිගු පෙදෙස, කොළඹ 15 | 011-2529479 011-2521152 |
| 2. | උසස් තාක්ෂණ ආයතනය ලබුදූව | සිරිධම්ම මාවත, ලබුදූව, අක්මීමණ | 091-2227880, 091-2246179 |

පාඨමාලාව සඳහා බඳවා ගැනීමට සෑම අයැදුම්කරුවෙක්ම පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය. :-

01. අයැදුම්කරු/අයැදුම්කාරිය ශ්‍රී ලංකා පුරවැසියෙකු වීම,
02. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් විසින් 2009 වර්ෂයේ හෝ ඊට පෙර පවත්වන ලද නව නිර්දේශයෙන් අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය හදාරණ ලද අයැදුම්කරුවන් අවම වශයෙන් සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන් තුනෙන් එක්වර සමත්ව තිබිය යුතු ය.,
03. අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාර්ථයක් ලබා තිබීම.

අයැදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 23ට අඩු අයදුම්කරුවන්ට ප්‍රමුඛත්වයක් දෙනු ලැබේ.

අයැදුම්කරුවන් සතියේ දිනයන්හි පාඨමාලාවන් සඳහා සහභාගී වීමට නිදහස් විය යුතු අතර සති අන්තයේ දී ද අවශ්‍යතා අනුව පාඨමාලා කටයුතුවලට සහභාගී වීමට හැකි විය යුතුය.

අයැදුම්කරුවන් තම අයැදුම්පත්‍රය පහත දැක්වෙන ආදර්ශ අයැදුම්පත්‍රයට අනුව පිළියෙල කරගත යුතුය.

ඒ ඒ පාඨමාලාවන්ට තෝරා ගැනීමේදී අ. පො. ස. (උ. පෙළ) ලකුණු වලට සාමාන්‍ය හෝ 'Z'- Score සැලකිල්ලට ගනු ලැබේ.

අයැදුම්පත්‍ර ගාස්තුව රු. 250 කි. එම ගාස්තු මුදල මහජන බැංකුව, හයිඩ් පාර්ක් කෝනර් ශාඛාවෙන් හෝ ශ්‍රී ලංකාවේ වෙනත් ඕනෑම මහජන බැංකු ශාඛාවක් මගින් 025100133397613 දරන ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ ජංගම ගිණුමට බැරකර ලබා ගන්නා ලද කුවිතාන්සිය අයැදුම්පතට ඇමිණිය යුතුය.

නියමිත අයුරින් සකස් කරනලද අයැදුම්පත්‍ර තමා විසින් ඉල්ලුම් කරනු ලබන ආයතනය වෙත 2010.08.14 දිනට පෙර ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. "උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයැදුම්පත්‍රය 2010/2011" යන්න ලියුම් කවරයෙහි වම්පස උඩ කෙළවරෙහි සටහන් කළ යුතු ය. උක්ත අංක දරන ගිණුමට හැර වෙනත් ගිණුම් වලට බැරකරන ලද කුවිතාන්සි සහිත අයැදුම්පත් හා අසම්පූර්ණ අයැදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලයක, අනුබද්ධිත විශ්ව විද්‍යාල ආයතනයක, කාර්මික විද්‍යාලයක, අධ්‍යාපන විද්‍යා පීඨයක/ගුරු පුහුණු ආයතනයක හෝ වෙනත් උසස් තාක්ෂණ ආයතනයක, අභ්‍යන්තර ශිෂ්‍යයෙකු වශයෙන් පාඨමාලාවක් හැදෑරීම සඳහා ලියාපදිංචි වී ඇති සිසුන් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ පූර්ණ කාලීන පාඨමාලාවක් හැදෑරීම සඳහා බඳවා ගැනීමට සුදුසුකම් නොලබයි. කිසියම් ශිෂ්‍යයෙකු එකම කාලය තුළදී වෙනත් ඉහත දැක්වූ රාජ්‍ය ආයතනයක පූර්ණ කාලීන ශිෂ්‍යයෙකු ලෙස පාඨමාලාවක් හදාරණ බව හෙළිදරවු වුවහොත් ඇයගේ/ඔහුගේ ලියාපදිංචිය ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය විසින් අවලංගු කරන බවද සැළකිය යුතු ය. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ ලියාපදිංචි සිසුන් සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම යටතේ වන ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයක ලියාපදිංචිය අහිමි බවද සැළකිය යුතුය.

මට්ටක්කුලිය හා ලබුදූව උසස් තාක්ෂණ ආයතනයන්හි ඉංජිනේරු අංශයට 2010/2011 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන බව කරුණාවෙන් සලකන්න.

එච්. ටී. කමල් පත්මසිරි,
අධ්‍යක්ෂ ජනරාල්.

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය,
අංක 18/2, වෝඩ් පෙදෙස,
කොළඹ 07.
Web site : www.sliate.net

*ආදර්ශ අයැදුම්පත්‍රය*

*ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය*

*උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා (උ. ජා. ඉ. ඩි) පාඨමාලාව සඳහා 2010/2011 අධ්‍යයන වර්ෂයට බඳවා ගැනීමේ අයැදුම්පත්‍රය*

ඉල්ලුම්කරන ආයතනය [ ]

01. අයැදුම්කරුගේ නම මුලකුරු සමග : [ ]

02. මුලකුරුවලින් කියවෙන නම : [ ]

03. ජාතික හැඳුනුම්පත් අංකය : [ ]
04. උපන් දිනය : [ ]
05. ස්ත්‍රී/පුරුෂ භාවය : [ ]

06. ස්ථිර ලිපිනය (පහත කොටුවෙහි ලියන්න) : [ ]
07. පරිපාලන දිස්ත්‍රික්කය : [ ]

08. වඩාත් කැමති ඉංජිනේරු ක්ෂේත්‍රයන් පිළිවෙලින් :

| | |
|---|---|
| පළමු තේරීම | |
| දෙවැනි තේරීම | |
| තෙවැනි තේරීම | |

09. ඉංග්‍රීසි විෂයය පිළිබඳ අ. පො. ස (සා. පෙළ) විභාගයෙන් ලත් ප්‍රතිඵල :

| වර්ෂය | විභාගය | විභාග අංකය | ලබාගත් සාමර්ථ්‍යය |
|---|---|---|---|

10. ඔබගේ අ. පො. ස. (උ. පෙළ) විභාගයේ හොඳම ප්‍රතිඵල (2009 හෝ ඊට පෙර) :

| වර්ෂය | විභාග අංකය | මාධ්‍යය |
|---|---|---|

| විෂයයන් | ශ්‍රේණිය |
|---|---|
| 1. සංයුක්ත ගණිතය | |
| 2. භෞතික විද්‍යාව | |
| 3. රසායන විද්‍යාව | |
| 4. සාමාන්‍ය පොදු පරීක්ෂණය | |
| Z/score | |

| අවස්ථාව | පළමුවන | | දෙවන | | තුන්වන | |
|---|---|---|---|---|---|---|

මම වෙනත් රාජ්‍ය ආයතනයක පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරන්නේ නැතිබව මෙයින් ප්‍රකාශ කර සිටිමි. වෙනත් රාජ්‍ය ආයතනයක එකම කාලය තුළදී වෙනත් පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරන බව හෙළිදරව් වුවහොත් මාගේ ලියාපදිංචි අවලංගු වන බව දනිමි. මෙහි සඳහන් තොරතුරු මාගේ දැනීම අනුව සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

(රු. 250 ක මුදල ගෙවූ බවට බැංකු කුවිතාන්සිය අමුණන්න)

07-574

---

## ශ්‍රී ලංකා පොලීසිය

### සහකාර පොලිස් අධිකාරිවරුන් තෝරා ගැනීමේ විවෘත තරග විභාගය - 2010

මෙම නිවේදනයේ 'අමාත්‍ය මණ්ඩලය' යන පදයෙන් අදහස් කෙරෙන්නේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ අමාත්‍ය මණ්ඩලයයි.

01. විභාගය :

1.1. සහකාර පොලිස් අධිකාරිවරුන් තෝරා ගැනීම සඳහා විවෘත තරග විභාගයක් 2010 වර්ෂයේ යම් දිනකදී කොළඹදී පවත්වනු ලැබේ. විභාගය පවත්වනු ලබන දිනය පසුව දැනුම් දෙනු ලැබේ.
1.2 මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.
1.3 පිරවිය යුතු පුරප්පාඩු සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරනු ලැබේ.
1.4 මහජන යහපත උදෙසා ඇබෑර්තු පිරවිය යුතු නොවේ යැයි අමාත්‍ය මණ්ඩලය තීරණය කළහොත් මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට හෝ හැකිය.

02. සුදුසුකම් :

2.1 සාමාන්‍ය පොලිස් සේවයේ සහකාර පොලිස් අධිකාරි තනතුර සඳහා :

2.1.1 විභාග අපේක්ෂයෙකු :

(අ) ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
(ආ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 32 ට නොවැඩි විය යුතුය.
(ඇ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයෙකු විය යුතුය.
(ඈ) යහපත් චරිතයක් ඇත්තෙකු විය යුතුය.
(ඉ) අවිවාහකයෙකු විය යුතුය.
(ඊ) මනා දේහ විලාශයකින් ද දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීම සඳහා සුදුසු ශාරීරික සෞඛ්‍යයෙන් ද යුක්ත විය යුතුය.
(උ) උපැස් හෝ ස්පර්ශ කාචයක් නොපැලද ඇස් පෙනීම අවම වශයෙන් 6/6 සහ 6/12 අතර ද වර්ණ පෙනීම සාමාන්‍ය ද විය යුතුය.
(ඌ) අවම වශයෙන් උස අඩි 05 යි, අඟල් 6 ක් විය යුතුය.
(එ) පිරිමියෙකු විය යුතුය.

*සටහන 1* අනෙකුත් සුදුසුකම් සපුරා තිබේනම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 35 ට නොවැඩි විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් ලබා ඇති පොලිස් නිලධාරීන්ට ද බාහිර අයදුම්කරුවන් ලෙස විභාගයට පෙනී සිටිය හැක. එම ඉල්ලුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

*සටහන 2* අවශ්‍ය ශාරීරික අවශ්‍යතාවයන්ගෙන් අඟල් භාගයක් අඩු වුවත්, අනෙකුත් අවශ්‍යතාවයන් සපුරාලන්නාවූ රට තුල හෝ රටින් පිට ශ්‍රී ලංකාව වෙනුවෙන් ක්‍රීඩා සඳහා පෙනී සිටි විශිෂ්ඨ ක්‍රීඩකයෙකු නම් හෝ ශ්‍රී ලංකාවේ ජාතික මට්ටමේ ක්‍රීඩා උත්සව සහ තරග වලදී ප්‍රශංසනීය ලෙස ක්‍රීඩා කුසලතාවන් දක්වා තිබේනම් එම අපේක්ෂකයින් බඳවා ගැනීමේ අයිතිය අමාත්‍ය මණ්ඩලය සතුය.

2.2 සහකාර පොලිස් අධිකාරී (වෛද්‍ය නිලධාරී) තනතුර සඳහා :

2.2.1 විභාග අපේක්ෂකයෙකු :

(අ) ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
(ආ) අයැදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 32 ට නොවැඩි විය යුතුය.
(ඇ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයක බටහිර වෛද්‍ය විද්‍යාව පිළිබඳ උපාධිධරයෙකු විය යුතුය.
(ඈ) ශ්‍රී ලංකා වෛද්‍ය මණ්ඩලයේ පූර්ණ ලියාපදිංචිය තිබිය යුතුය.
(ඉ) විවාහක හෝ අවිවාහක විය හැක.
(ඊ) මනා දේහ විලාශයකින් ද දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීම සඳහා සුදුසු ශාරීරික සෞඛ්‍යයෙන් ද යුක්ත විය යුතුය.
(උ) පිරිමි හෝ කාන්තා විය හැක.

2.2.2 සහකාර පොලිස් අධිකාරී (වෛද්‍ය නිලධාරී) තනතුරෙහි වෘත්තීය ප්‍රගමනය නියෝජ්‍ය පොලිස්පති (වෛද්‍ය නිලධාරී) තනතුර දක්වා පමණක් වේ.

2.3 සහකාර පොලිස් අධිකාරී (තොරතුරු තාක්ෂණ) තනතුර සඳහා :

2.3.1 විභාග අපේක්ෂකයෙකු :

(අ) ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
(ආ) අයැදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 32 ට නොවැඩි විය යුතුය.
(ඇ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයක තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධිධරයෙකු විය යුතුය.
(ඈ) විවාහක හෝ අවිවාහක විය හැක.
(ඉ) මනා දේහ විලාශයකින් ද දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීම සඳහා සුදුසු ශාරීරික සෞඛ්‍යයෙන් ද යුක්ත විය යුතුය.
(ඊ) පිරිමි හෝ කාන්තා විය හැක.

2.3.2 සහකාර පොලිස් අධිකාරී තොරතුරු (තාක්‍ෂණ) ය තනතුරෙහි වෘත්තීය ප්‍රගමනය නියෝජ්‍ය පොලිස්පති (තොරතුරු තාක්‍ෂණ) තනතුර දක්වා පමණක් වේ.

2.4 සහකාර පොලිස් අධිකාරී (සිවිල් ඉංජිනේරු) තනතුර සඳහා :

2.4.1 විභාග අපේක්ෂයෙකු :

(අ) ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
(ආ) අයැදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 32 ට නොවැඩි විය යුතුය.
(ඇ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයක සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධිධරයෙකු විය යුතුයි.
(ඈ) විවාහක හෝ අවිවාහක විය හැක.
(ඉ) මනා දේහ විලාශයකින් ද දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීම සඳහා සුදුසු ශාරීරික සෞඛ්‍යයෙන් ද යුක්ත විය යුතුය.
(ඊ) පිරිමි හෝ කාන්තා විය හැක.

2.4.2 සහකාර පොලිස් අධිකාරී (සිවිල් ඉංජිනේරු) තනතුරෙහි වෘත්තීය ප්‍රගමනය නියෝජ්‍ය පොලිස්පති (සිවිල් ඉංජිනේරු) තනතුර දක්වා පමණක් වේ.

2.5 සහකාර පොලිස් අධිකාරී (ගෘහ නිර්මාණ ශිල්පී) තනතුර සඳහා :

2.5.1 විභාග අපේක්ෂයෙකු :

(අ) ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
(ආ) අයැදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 32 ට නොවැඩි විය යුතුය.
(ඇ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලක වාස්තු විද්‍යාව පිළිබඳ උපාධිධරයෙකු විය යුතුය.
(ඈ) විවාහක හෝ අවිවාහක විය හැක.
(ඉ) මනා දේහ විලාශයකින් ද දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීම සඳහා සුදුසු ශාරීරික සෞඛ්‍යයෙන් ද යුක්ත විය යුතුය.
(ඊ) පිරිමි හෝ කාන්තා විය හැක.

2.5.2 සහකාර පොලිස් අධිකාරී (ගෘහ නිර්මාණ ශිල්පී) තනතුරෙහි වෘත්තීය ප්‍රගමනය නියෝජ්‍ය පොලිස්පති (ගෘහ නිර්මාණ ශිල්පී) තනතුර දක්වා පමණක් වේ.

2.6 සහකාර පොලිස් අධිකාරී (විදුලි ඉංජිනේරු) තනතුර සඳහා :

2.6.1 විභාග අපේක්ෂකයෙකු :

(අ) ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
(ආ) අයැදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 32 ට නොවැඩි විය යුතුය.
(ඇ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයක විදුලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධිධරයෙකු විය යුතුය.
(ඈ) විවාහක හෝ අවිවාහක විය හැක.
(ඉ) මනා දේහ විලාශයකින් ද දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීම සඳහා සුදුසු ශාරීරික සෞඛ්‍යයෙන් ද යුක්ත විය යුතුය.
(ඊ) පිරිමි හෝ කාන්තා විය හැක.

2.6.2 සහකාර පොලිස් අධිකාරී (විදුලි ඉංජිනේරු) තනතුරෙහි වෘත්තීය ප්‍රගමනය නියෝජ්‍ය පොලිස්පති (විදුලි ඉංජිනේරු) තනතුර දක්වා පමණක් වේ.

2.7 සහකාර පොලිස් අධිකාරී (කාර්මික ඉංජිනේරු) තනතුර සඳහා :

2.7.1 විභාග අපේක්ෂයෙකු :

(අ) ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
(ආ) අයැදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 32 ට නොවැඩි විය යුතුය.
(ඇ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයක කාර්මික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධිධරයෙකු විය යුතුය.
(ඈ) විවාහක හෝ අවිවාහක විය හැක.
(ඉ) මනා දේහ විලාශයකින් ද දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීම සඳහා සුදුසු ශාරීරික සෞඛ්‍යයෙන් ද යුක්ත විය යුතුය.
(ඊ) පිරිමි හෝ කාන්තා විය හැක.

2.7.2 සහකාර පොලිස් අධිකාරී (කාර්මික ඉංජිනේරු) තනතුරෙහි වෘත්තීය ප්‍රගමනය නියෝජ්‍ය පොලිස්පති (කාර්මික ඉංජිනේරු) තනතුර දක්වා පමණක් වේ.

2.8 සහකාර පොලිස් අධිකාරී (ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු) තනතුර සඳහා :

2.8.1 විභාග අපේක්ෂයෙකු :

(අ) ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
(ආ) අයැදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 32 ට නොවැඩි විය යුතුය.
(ඇ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයක ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු විද්‍යාව පිළිබඳව උපාධිධරයෙකු විය යුතුය.
(ඈ) විවාහක හෝ අවිවාහක විය හැක.
(ඉ) මනා දේහ විලාශයකින් ද දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීම සඳහා සුදුසු ශාරීරික සෞඛ්‍යයෙන් ද යුක්ත විය යුතුය.
(ඊ) පිරිමි හෝ කාන්තා විය හැක.

2.8.2 සහකාර පොලිස් අධිකාරී (ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු) තනතුරෙහි වෘත්තීය ප්‍රගමනය නියෝජ්‍ය පොලිස්පති (ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු) තනතුර දක්වා පමණක් වේ.

2.9 සහකාර පොලිස් අධිකාරී (පශු වෛද්‍ය) තනතුර සඳහා :

2.9.1 විභාග අපේක්ෂකයෙකු :

(අ) ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
(ආ) අයැදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 32 ට නොවැඩි විය යුතුය.
(ඇ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයක පශු වෛද්‍ය වේදය පිළිබඳ උපාධිධරයෙකු විය යුතුය.
(ඈ) ශ්‍රී ලංකා පශු වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී සිටිය යුතුයි.
(ඉ) විවාහක හෝ අවිවිවාහක විය හැක.
(ඊ) මනා දේහ විලාශයකින් ද දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීම සඳහා සුදුසු ශාරීරික සෞඛ්‍යයෙන් ද යුක්ත විය යුතුය.
(උ) පිරිමි හෝ කාන්තා විය හැක.

2.9.2 සහකාර පොලිස් අධිකාරී (පශු වෛද්‍ය) තනතුරෙහි වෘත්තීය ප්‍රගමනය නියෝජ්‍ය පොලිස්පති (පශු වෛද්‍ය) තනතුර දක්වා පමණක් වේ.

2.10 සහකාර පොලිස් අධිකාරී (බටහිර තූර්ය වාදක) තනතුර සඳහා :

2.10.1 විභාග අපේකකයෙකු :

(අ) ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
(ආ) අයැදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 32 ට නොවැඩි විය යුතුය.
(ඇ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයක සෞන්දර්යය සංගීතවේදී උපාධිය හෝ ඊට සමාන උපාධියක් ලබා තිබීම.
(ඈ) ලන්ඩන් රාජකීය/ ට්‍රින්ටි සංගීත විද්‍යාලයේ බටහිර සංගීතය පිළිබඳ ඩිප්ලෝමාවක් (ප්‍රායෝගික හා න්‍යාය) ලබා තිබිය යුතුය. ලන්ඩන් රාජකීය/ට්‍රින්ටි ඩිප්ලෝමාව (ප්‍රායෝගික) පමණක් සමත්වී තිබේනම් බටහිර සංගීත VI වැනි ශ්‍රේණිය න්‍යාය සමත්වී තිබිය යුතුය.
(ඉ) බටහිර සංගීත භාණ්ඩ (Brass Wood Wind Instruments); (Piano String Instruments) සහ වාදනය කිරීමේ හැකියාව තිබිය යුතුය.
(ඊ) බටහිර සංගීත කණ්ඩායම් මෙහෙයවීම, බටහිර සංගීත සැකසීම (Arrangements) පිළිබඳ දැනුම තිබිය යුතුය.
(උ) මනා දේහ විලාශයකින් ද දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීම සඳහා සුදුසු ශාරීරික සෞඛ්‍යයෙන් ද යුක්ත විය යුතුය.
(ඌ) පිරිමි හෝ කාන්තා විය හැක.
(එ) විවාහක හෝ අවිවාහක විය හැක.

2.10.2 සහකාර පොලිස් අධිකාරී (බටහිර තූර්ය වාදක) තනතුරෙහි වෘත්තීය ප්‍රගමනය නියෝජ්‍ය පොලිස්පති (බටහිර තූර්ය වාදක) තනතුර දක්වා පමණක් වේ.

03. ඉහත අංක 2.2 සිට 2.10 දක්වා ඇති තනතුරු සඳහා බඳවා ගන්නා අයැදුම්කරුවන්/අයැදුම්කාරියන් සඳහා වැඩිදුර අධ්‍යාපන කටයුතු සඳහා පහසුකම් ලබාදෙනු ලැබේ.

04. ඉහත 2.2 සිට 2.10 දක්වා ඇති තනතුරු සඳහා බඳවා ගන්නා නිලධාරීන්/නිලධාරිනියන් පොලිස් රාජකාරී සඳහා යොදාගනු නොලබන අතර ඔවුන් බඳවා ගත් වෘත්තියේ රාජකාරි සඳහා පමණක් යොදාගනු ලැබේ.

05. වැටුප් පරිමාණය :-
2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 අනුව එස්. එල්. 1-2006 වැටුප් පරිමාණය අදාල වේ. ඒ අනුව, මාසික වැටුප් පරිමාණය

රු. 22,935, - 10 x 645 - 8 x 790 - 17 x 1,050 - රු. 53,555 (රු. 24,870 ට පෙර කාර්යක්ෂමතා කඩඉමකි)

06. තෝරා ගැනීමේ ක්‍රමවේදය :
අයැදුම්කරුවන් තෝරාගැනීමේ ක්‍රම වේදය පහත පරිදිය.

6.1 මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණය

ලැබී ඇති අයදුම්පත් අතුරින්, අයැදුම්කරුවන් මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. මෙම පරීක්ෂණයේදී

(අ) උස පරීක්ෂා කරනු ලැබේ.
(ආ) සහතිකවල මුල් පිටපත් පරීක්ෂාවට භාජනය කරනු ලබයි.

6.2 ලිඛිත විභාගය :

මූලික සුදුසුකම් සපුරා ඇති අයැදුම්කරුවන් පමණක් ලිඛිත විභාගය සඳහා කැඳවීම් කරනු ලැබේ. ලිඛිත විභාගය සඳහා කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, පහත සඳහන් විෂයන්ගෙන් සමන්විත වේ. එක් එක් ප්‍රශ්න පත්‍රයට අදාල කාලය සහ ලකුණු පහත පරිදිය.

(1) බුද්ධි පරීක්ෂණය - කාලය පැය 01 - ලකුණු 100
(2) සාමාන්‍ය දැනීම - කාලය පැය 01 - ලකුණු 100
(3) භාෂා ප්‍රවීණතාවය - කාලය පැය 02 - ලකුණු 100

6.3 වාචික පරීක්ෂණය

වාචික පරීක්ෂණය සඳහා ලකුණු 100 ක් වෙන් වේ.

සටහන - I මෙම පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ ලිඛිත පරීක්ෂණයේදී යටත් පිරිසෙයින් 40% ක් වත් ලකුණු ලබා ගත් අයැදුම්කරුවන්ගෙන් ලකුණුවල එකතුවට අනුව සකස්කළ ප්‍රමුඛතා ලේඛනයෙනි.

සටහන - II ලිඛිත විභාගයේදී ලද ලකුණු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් නොකරනු ඇත.

6.4 පසුබිම් පරීක්ෂණය

අයැදුම්කරුවන්ගේ යහපත් චරිතය සහ හැසිරීම පිළිබඳව සලකා බැලීම පිණිස ඔහුගේ/ඇයගේ සහ ඔහුගේ/ඇයගේ ළඟම ඥාතීන් සහ හඳුනන අය පිළිබඳව පසුබිම් වාර්තාවක් ලබා ගනු ඇත.

අපේක්ෂකයෙකු බඳවා ගැනීමේදී අසත්‍ය තොරතුරු සැපයීම හෝ අයහපත් පසුබිම් වාර්තාවක් ඇත්තෙකු වීම බඳවා නොගැනීමට හෝ බඳවා ගැනීමෙන් පසු සේවය අවලංගු කිරීමට හෝ හේතුවනු ඇත.

6.5 වෛද්‍ය පරීක්ෂණය

තෝරාගනු ලබන අපේක්ෂකයින් විසින්, දිවයිනේ ඕනෑම පළාතක පොලිස් නිලධාරියෙකු ලෙස සේවය කිරීම සඳහා ඔවුන් සතුව ඇති ශාරීරික යෝග්‍යතාවය පිළිබඳ වෛද්‍ය පරීක්ෂණයට පෙනී සිටිය යුතුය.

6.6 පුහුණුවට කැඳවීම :

වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් අයදුම්කරුවන්/අයදුම්කාරියන් පමණක් පුහුණුව සඳහා කැඳවනු ලැබේ. සියලුම තනතුරු සඳහා තෝරා ගන්නා ලද අයදුම්කරුවන්/අයදුම්කාරියන් වසරක මූලික පුහුණු කාලයක් සඳහා යටත් වේ.

07. විභාග මාධ්‍යය :

(අ) විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලැබේ.
(ආ) අපේක්ෂකයෙකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ සුදුසුකම් ලත් විභාගයෙන් සාමාර්ථය ලත් භාෂාවෙන්ම හෝ රාජ්‍ය භාෂාවෙන් විය යුතුය.
(ඇ) අපේක්ෂකයෙකු සුදුසුකම් ලත් විභාගයෙන් විෂයයන් භාෂා දෙකකින් හෝ වැඩි ගණනකින් හෝ සමත් වී ඇත්නම් එම විභාගයේ දී ඔහු සමත් වූ විෂයන්ගෙන් වැඩි ගණනකට පෙනී සිටි භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් විභාගයට පෙනී සිටිය යුතුය.
(ඈ) ප්‍රධාන විෂය එක් භාෂාවකිනුත්, අතිරේක විෂය තවත් භාෂාවකිනුත් සමත් වී ඇති විශේෂ උපාධියක් ඇති අපේක්ෂකයෙකු ප්‍රධාන විෂයයෙන් සාමාර්ථය ලත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විභාගයට පෙනී සිටිය යුතුය.

සටහන -

i. ඉහත (අ) සහ (ඇ) හි සුදුසුකම් ලත් විභාගය යන පදයෙන් අදහස් කෙරෙන්නේ 2.1 ඇ ඡේදයේ සහ 2.1 හි සටහන 1හි ඇති විභාගය වේ.
ii. අපේක්ෂකයෙකු විභාගයේදී පෙනී සිටින සියළුම ප්‍රශ්න පත්‍ර වලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.
iii. තම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් භාෂා මාධ්‍යය වෙනස් කිරීමට අපේක්ෂකයෙකුට ඉඩ දෙනු නොලැබේ.

08. විෂය නිර්දේශය :

(1) බුද්ධි පරීක්ෂණය - කාලය පැය 01 යි- ලකුණු 100 යි.

පද සංඛ්‍යා සහ රූප වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටළු විෂයෙහි අපේක්ෂකයින් දක්වන අනුමාන සහ ප්‍රතිචාර ආශ්‍රයෙන් එම ගැටළු පිළිබඳ අර්ථාවබෝධය ප්‍රමාණිකරණය සහ අවකාශය අතර, සහ සම්බන්ධතා වටහා ගැනීමෙහිලා අපේක්ෂකයන් සතු හැකියාව අගයීම.

(2) සාමාන්‍ය දැනීම - කාලය පැය 01 යි - ලකුණු 100 යි

ජාතික, කලාපීය හා සමස්ථ ලෝකයේ විවිධ සංවිධාන පරිසරයන් තුල මෙන්ම අප සමාජය තුල පවත්නා සමාජීය, සංස්කෘතික, අධ්‍යාපනික, විද්‍යාත්මක, දේශපාලනික, ආර්ථික හා අදාල වෙනත් සාධකයන් සම්බන්ධයෙන් අපේක්ෂකයින්ගේ දැනුවත්භාවය සහ අවබෝධය මැනීම.

(3) භාෂා ප්‍රවීනතාවය - (අවබෝධය හා වාක්‍ය රචනය)
කාලය පැය 02 යි - ලකුණු 100 යි

දෙන ලද මාතෘකා/තේමා සමූහයකින් අපේක්ෂකයා තෝරා ගත් මාතෘකාවක්/තේමාවක් මනසින් ග්‍රහනය කොට විචාර බුද්ධියෙන් සලකා බැලීමේ හැකියාව සහ ඒ පිළිබඳ තොරතුරු හා අදහස් ඒකරාශී කොටගෙන සංවිධානයෙන් යුතුව ඉදිරිපත් කිරීමේ ශක්තිය පරීක්ෂා කිරීම් සහ සැලකිය යුතු තරම් සංකීර්ණ වූ ඡේදයක් හෝ ලේඛන කාණ්ඩයක් හෝ සංදේශයක් හෝ අවබෝධ කරගෙන එහි ඇති මුඛ්‍ය අදහස් සැකෙවින් හා පැහැදිලිවත් නිවැරදිවත් අපේක්‍ෂකයාගේම වචනවලින් ප්‍රකාශ කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම.

09. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :

(අ) ඉල්ලුම් පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් අඟල් 8 x 12 (ඒ 4) ප්‍රමාණයේ කඩදාසියක සකස් කර අපේක්ෂකයාම පිරවිය යුතුය. 1.5 දක්වා වන ශීර්ෂ ඉල්ලුම්පත් කඩදාසියේ පලමුවැනි පැත්තේ ද 6-10 දක්වා ශීර්ෂ එහි අනික් පැත්තේ ද වන පරිද්දෙන් තම ඉල්ලුම් පත්‍රය සකස් කළ යුතු බව විශේෂයෙන් සැලකිය යුතුය.

(ආ) ඉල්ලුම් පත්‍රය අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂාවෙන්ම විය යුතුය.

(ඇ) විභාගය සඳහා වන සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් 2010.09.06 වැනි දින හෝ ඊට කලින් හෝ අධ්‍යක්ෂ/බඳවා ගැනීම්, ආධුනිකයින් බඳවා ගන්නා කාර්යාලය, නො. 375, හැව්ලොක් පාර, කොළඹ 06 වෙතට එවිය යුතුය. ඉල්ලුම් පත්‍රය බහා ඇති කවරයේ ඉහළ වම්පස කෙලවරේ "සහකාර පොලිස් අධිකාරීවරුන් තෝරා ගැනීමේ විවෘත තරඟ විභාගය 2010" යන වචන පැහැදිලිව පෙනෙන ලෙස ලිවිය යුතුය. මෙදිනට පසුව ලැබෙන කිසිම ඉල්ලුම්පතක් භාරගනු නොලැබේ.

(ඈ) සෑම ආකාරයෙන් සම්පූර්ණ නොවන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේදී ඉල්ලුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

10. ගාස්තු :

10.1.1 ඇතුලත්වීමේ ගාස්තුව රු. 300 කි.

10.1.2 මෙම ගාස්තුව ආදායම් ශීර්ෂ 4000-20-03-20-13 ට බැර කරන ලෙසට උපදෙස් සහිතව අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට ප්‍රථම ආසන්නව පිහිටි දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවිය යුතුය. දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත් ලදුපත් කුවිතාන්සි ඉල්ලුම්පත්‍රයට ඇමිණිය යුතුය. ඉල්ලුම්පත්‍රයේ හා ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

10.2 මෙම ගාස්තුව සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ ආපසු ගෙවනු නොලැබේ.

11. අයැදුම්පත් භාර ගැනීම :

11.1 ඉල්ලුම්පත් ලද බව දන්වනු නොලැබේ. ඉල්ලුම්කරුවන්ට මූලික පරීක්ෂණය සඳහා කැඳවීම් ලිපි නිකුත් කල විගසම පුවත්පත් වල දැන්වීමක් පල කරනු ලැබේ. එවැනි දැන්වීමක් පිළිබඳ විමසිල්ලෙන් සිටින ලෙස අයැදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

11.2 මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් පසු ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කරනු ලබන ලේඛනය සමග වන ඉල්ලුම්පත්‍ර සඳහා විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. අයදුම්කරුවන් විසින් තමන්ගේ ප්‍රවේශපත්‍ර අත්සන සහතික කරවාගෙන විභාග මධ්‍යස්ථානය භාර ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ කිරීමට අසමත් වන අපේක්ෂකයින්ට මෙම විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

11.3 ඉල්ලුම්කරුවන් තමන් සඳහා නියම කර තිබෙන විභාග ශාලාවෙහි ම තම විභාගයට පෙනී සිටිය යුතුය. තමන්ට නියමිත විභාග ශාලාව හැර අන්‍ය විභාග ශාලාවක දී කිසිම විභාග අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

11.4 විභාගයට යටත් පිරිසෙයින් දින 07 කට වත් කලින් ප්‍රවේශ පත්‍ර නොලැබුනු විභාග අපේක්ෂකයින් ඒ බව වහාම විභාග කොමසාරිස් ජනරාල් වෙත දැනුම් දිය යුතු ය. ඔහුට මේ බව දැනුම් දෙන විට පහත සඳහන් තොරතුරු සැපයිය යුතුය.

1. අයැදුම්කළ තනතුර :—————.
2. විභාගයේ නම :—————.
3. අයැදුම්කරුගේ සම්පූර්ණ නම :—————.
4. සම්පූර්ණ ලිපිනය :—————.
5. අයදුම්පත එවූ තැපැල් කාර්යාලය, ලියාපදිංචි කළ අංකය හා දිනය :—————.
6. මුදල් ගෙවන ලද ස්ථානය, මුදල් ගෙවූ දිනය හා ලදුපත් අංකය :—————.

11.5 විභාගයට ඇතුලත් කර ගැනීම සුදුසුකම් පිළිගැනීමක් ලෙස අදහස් නොකෙරේ.

12. අයැදුම්කරුවන්ගේ අත්සන සහතික කිරීම :

12.1 දැනට රජයේ සේවයේ යෙදී සිටින අපේක්ෂකයින්ගේ අත්සන් සහතික කල යුත්තේ ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලය ලත් නිලධාරියෙකු හෝ විසිනි.

12.2 අනෙකුත් අයැදුම්කරුවන්ගේ අත්සන් සහතික කළ යුත්තේ එසේ කිරීමට බලයලත් කෙනෙකු විසිනි. එනම්, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු, රජයේ පාසලක විදුහල්පතිවරයෙකු, නාවික, ගුවන් හෝ යුධ හමුදාවේ අධිකාරී ලත් නිලධාරියෙකු හෝ රු.2,33,580 ක් හෝ ඊට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියෙකු විසිනි.

13. අපේක්ෂකයාගේ අනන්‍යතාව :

අපේක්‍ෂයකින් විසින් තමන් පෙනී සිටින එක් එක් විෂය සඳහා විභාග ශාලාවේ දී ශාලාධිපති සෑහීමකට හේතුවන පරිදි තම අනන්‍යතාවය ඔප්පු කල යුතුය. ඒ සඳහා පහත සඳහන් ලේඛන වලින් එකක් පිළිගනු ඇත.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ජාතික හැඳුනුම්පත.

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රයක්.

14. වැරදි තොරතුරු සැපයීම පිළිබඳ දඬුවම් :

මෙම විභාගයට අදාල රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂයෙකු එයට පෙනී සිටීමට නුසුදුසු යැයි පෙනී ගියහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු කවර අවස්ථාවක දී වුවද ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය. අපේක්ෂකයෙකු විසින් සපයන ලද තොරතුරු කිසිවක් වැරදි බව පෙනී ගියහොත් හෝ ඔහු විසින් උවමනාවෙන්ම කිසියම් වැදගත් කාරණයක් වසන් කරන ලද නම් හෝ බඳවා ගැනීමෙන් පසු ඔහු රජයේ සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වනු ඇත.

15. ලියවිලි :

මතු දැක්වෙන මුල් ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස නියම කළ විට අපේක්ෂකයින් විසින් ඒවා ඉදිරිපත් කළ යුතු වේ. :-

(අ) උප්පැන්න සහතික පත්‍රය (පාඨශාලාවල භාවිතය සඳහා නිකුත් කරන ලද සහතිකය හෝ බෞතීස්ම සහතිකය හෝ මේ සඳහා පිළිගනු නොලැබේ.)

(ආ) අධ්‍යාපන සුදුසුකම් හා ප්‍රායෝගික පලපුරුද්ද පිළිබඳ සහතික පත්‍ර

(ඇ) පාසැල්වලින් ලබා ගෙන ඇති සහතික ද ඇතුළුව චරිත සහතික 04 කට නොවැඩි ගණනක් එම සහතික අතරින් අඩු වශයෙන් එකක්වත් තම අධ්‍යයන උපදේශකවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් හෝ ලබා ගත් එකක් විය යුතුයි.

16. අයථා අනුග්‍රහයන් :

යම් අපේක්ෂකයෙකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවද අයථා අනුග්‍රහයන් ලබා ගැනීමට හෝ බලපෑමකට හෝ උත්සාහයක් දැරීම එම අපේක්ෂකයා නුසුදුස්සෙකු වීමට හේතුවනු ඇත.

17. බඳවා ගැනීමේ කොන්දේසි :

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ/අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

18. පොදු කොන්දේසි :

(i) ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ (II) 'අ' කොටසේ මුලින්ම පළ වී ඇති රාජ්‍ය සේවයෙහි තනතුරු වලට අදාල පත්වීම් පිළිබඳ පොදු කොන්දේසි වෙත ද අපේක්ෂකයින්ගේ අවධානය යොමු කරනු ලැබේ.

(ii) සියලුම තනතුරු සඳහා බඳවා ගන්නා ලද සහකාර පොලිස් අධිකාරීවරුන් 1865 අංක 16 දරන පොලිස් ආඥාපනත සහ එහි සංශෝධයන් හි ඇති විධිවිධානවලට යටත් වේ.

(iii) ස. පො. අ. (වෛද්‍ය නිලධාරී) තනතුර, සා.පො. අ. (තොරතුරු තාක්ෂණ) තනතුර, සා. පො. අ. (සිවිල් ඉංජිනේරු) තනතුර ස. පො. අ. (ගෘහ නිර්මාණ ශිල්පී) තනතුර, ස. පො. අ. (විදුලි ඉංජිනේරු) තනතුර, ස.පො.අ. (කාර්මික ඉංජිනේරු) තනතුර, ස.පො.අ. (වෛද්‍ය නිලධාරී) තනතුර, සපො.අ. (ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු) තනතුර, ස.පො.අ. (පශු වෛද්‍ය) තනතුර, ස.පො.අ. (බටහිර තූර්ය වාදක) තනතුර සඳහා අයැදුම්කර ඇති අයැදුම්කරුවන්ට සාමාන්‍ය පොලිස් සේවයේ සහකාර පොලිස් අධිකාරී තනතුර සඳහා අයැදුම්කළ නොහැක.

(iv) සෑම තනතුරක් සඳහාම බඳවා ගන්නා නිලධාරීන්/ නිලධාරිනියන් දිවයිනේ සෑම පළාතකම සේවය කිරීමට යටත් වේ.

19. මෙම දැන්වීමෙන් විධිවිධාන සැලසී නොමැති වෙනත් යම්කිසි කරුණක් වෙතොත් එය අමාත්‍ය මණ්ඩල අභිමතය පරිදි තීරණය කරනු ලැබේ.

රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය,
හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ නියමය පරිදි,

ආචාර්ය මහින්ද බාලසූරිය,
පොලිස්පති.

2010ක් වූ ජූලි මස 07 වැනි දින,
පොලිස්පති,
කොළඹ 01,
පොලිස් මූලස්ථානයේ දී ය.

**ආදර්ශ අයැදුම්පත්‍රය**

***ශ්‍රී ලංකා පොලීසිය***

*සහකාර පොලිස් අධිකාරිවරුන් තෝරා ගැනීමේ විවෘත තරග විභාගය - 2010*

[ ]
කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
(සිංහල -2 , දෙමළ - 3, ඉංග්‍රීසි - 4) [ ]
(අදාල අංකය කොටුව තුල ලියන්න)

01. අයැදුම්කරන තනතුර :—————.
02. නම :—————.
    2.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :—————.
    (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් *උදා* : SILVA, A. B.)
    2.2 සම්පූර්ණ නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :—————.
    2.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :—————.
    2.4 ජාතික හැඳුනුම්පත් අංකය :
    [ | | | | | | | | | ]
    2.5 නිකුත් කළ දිනය : [ ]

03. ලිපිනය :
    3.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.
    3.2 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :—————.
    3.3 රාජකාරි ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්, අදාළ නම් පමණි) :—————.
    3.4 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.

04. 4.1 ජන වර්ගය :
    සිංහල 1, දෙමළ 2, ඉන්දියානු දෙමළ 3, මුස්ලිම් 4, වෙනත් 5
    (අදාල අංකය කොටුව තුල ලියන්න) [ ]
    4.2 ස්ත්‍රී පුරුෂ භාවය :
    ස්ත්‍රී - 1, පුරුෂ - 0
    (අදාල අංකය කොටුව තුල ලියන්න) [ ]
    4.3 විවාහක/අවිවාහක බව : [ ]
    අවිවාහකයි -1, විවාහකයි - 2
    (අදාල අංකය කොටුව තුල ලියන්න)
    4.4 උපන් දිනය :
    වර්ෂය [ | | | ] මාසය [ | ] දිනය [ | ]
    4.5 ................. දිනට වයස
    වර්ෂ [ | | | ] මාස [ | ] දින [ | ]

05. (i) උපාධිය ලද දිනය :—————.
    (ii) විශ්ව විද්‍යාලය/ආයතනය :—————.
    (iii) ලියාපදිංචි වූ අංකය හා දිනය :—————.
    (iv) බාහිර/අභ්‍යන්තර :—————.
    (v) උපාධිය :—————.
    (vi) විෂයයන් :—————.
    (vii) පන්තිය :—————.
    (viii) ඉහළ/පහළ :—————.
    (ix) විභාග අංකය :—————.
    (x) විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය :—————.

06. ශාරීරික යෝග්‍යතාවය :
    (i) උස : අඩි :—————., අඟල් :—————.
    (ii) පපුව (ප්‍රසාරණයකල විට) අඟල් :—————.
    (පිරිමි අයදුම්කරුවන්ට පමණි)

07. ඔබ දැනට පොලිස් නිලධාරියෙකු වශයෙන් පත්වීම් උසුලන්නේ ද?
:—————.

එසේනම් දැනට දරන තනතුර සහ පත්වීම ලැබූ දිනය සඳහන් කරන්න
:—————.

08. මුදල් කුවිතාන්සිය මනා ලෙස අලවන්න. කුවිතාන්සියේ ඡායා පිටපතක් ළග තබා ගන්න.

[ ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න. ]

09. අයදුම්කරුගේ සහතිකය :

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, ........................දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ඇතුලත්වීමේ ගාස්තු ගෙවන ලද අංක ............හා

............වැනි දින දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද විභාග නීති රීතිවලට අනුව ක්‍රියා කිරීමටත් මෙම විභාගය පිළිබඳව කොන්දේසි අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන්පසුව මගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි.

————,
අයැදුම්කරුගේ අත්සන.

දිනය :————.

10. අයැදුම්කරුගේ අත්සන සහතික කිරීම (*ගැසට් නිවේදනයේ 10 වැනි ඡේදය පරිදි විය යුතුය*).

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන ........................ (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත්, ............ දින ඔහුගේ/ඇයගේ අත්සන ............ දින මා ඉදිරියේ දී තැබූ බවත්, මම සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.

අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.

තනතුර :————.

ලිපිනය :————.

11. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය (අදාලනම් පමණි.)

මෙම අයැදුම්පත ඉදිරිපත් කරන........................ මයා/මිය/මෙනවිය ............ දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ සේවයේ නියුතු අයෙකු බවත්, ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවත් ප්‍රකාශ කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

තනතුර :————.
දිනය :————.

07-652